# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,879 — 1969 නොවැම්බර් 7 වැනි සිකුරාදා — 1969.11.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... ... | 223 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... | — |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | — | | |


සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වෙනි කොටසේ ජූරි සභිකයන්ගේ හා උප්දේශකවරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇල්ලන් වතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරි දිනකම දහයේ සිට හතර දක්වා ද, සෑම වරුවේ දිනවල දහයේ සිට එක දක්වා ද ලේඛණ පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරි දිනවල සවස 3 දක්වා ද, වරුවේ දිනවල දවල් 12 දක්වා ද භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියා පදිංචි කරනු ලැබීමෙන් පසු වෙළඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක් සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් (වෙළෙඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ) තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්‍යාලයීය අංකය සමග දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්‍යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.


233—බී 69479—9,030 (69/11)

## විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුඬවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නොකරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමඟ ටී. ඇම්. 7 දරණ පෝර්ම මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම්කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සැහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නො කළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සළකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්යය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

---

(1) වෙළඳ ලකුණේ අංකය : 28,232 ; (2) ලැබුණු දිනය : 1966 අගෝස්තු මස 20 වෙනි දින ; (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : දළුවතුමුල්ල ගමගේ සැමී ද සිල්වා, "යුනයිටඩ් ඩිස්පැන්සරි" නමින් වෙළඳාම් කරයි. 38, මහවීදිය, කන්තලේ ; නිෂ්පාදකයා ; (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහිවූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය : යූ. රණසිරි රුද්‍රිගෝ, 425/14, හැව්ලොක් පාර, කොළඹ 6 ; (5) පන්තිය : (3) ; (6) බඩු : සම මතුපිට රෝග සඳහා බෙහෙත් ; (7) වෙළඳ ලකුණේ සටහන :




මෙම ලකුණු ලියාපදිංචි කිරීමේදී "ඩී.ජී.ඇස්." සහ "අළුහම් ප්‍රලේපය" යන වචන සඳහා තනි අයිතියක් නොලැබේ.

ජේ. එෆ්. පොන්නම්බලම්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,
1969 ජනවාරි මස 18 දින.

11-379

---

(1) වෙළඳ ලකුණේ අංකය : 31,306 ; (2) ලැබුණු දිනය : 1969 මාර්තු මස 31 දින ; (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : හාජි දොස්තර ඒ. ඇම්. අන්වර් ඇන්ඩ් කම්පැනි නමින් වෙළඳාම් කරන සිත්ති fපාතිමා මොහමඩ් අන්වර්, අංක 15/1, ශ්‍රී මුරුගන් වීදිය, කොළඹ 2 ; ඖෂධ නිෂ්පාදකයෝ, කර්මාන්තකරුවෝ, ආනයන සහ අපනයන කරුවෝ ; (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය :—— ; (5) පන්තිය : 3 ; (6) බඩු : වෛද්‍යකර්මය සහ භිෂග්කර්මය සඳහා පිළියෙළ කළ රසායනික සංයෝග, ඖෂධ සංයෝග සහ පේටන්ට් ඖෂධ ; (7) වෙළඳ ලකුණේ සටහන :

**G R I M I X**


ජේ. එෆ්. පොන්නම්බලම්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,
1969 ඔක්තෝබර් 16.

11-380

---

(1) වෙළඳ ලකුණේ අංකය : 30,802 ; (2) ලැබුණ දිනය : 1968 ඔක්තෝබර් 27 ; (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : "ටාටා ඉන්ඩස්ට්‍රීස්" නමින් වෙළඳාම් කරන කදිරවේළු තම්බයියා, අංක 21, රයිපල් වීදිය, කොළඹ 2 ; තොප්පි, කැප්තොප්පි, බැනියන්, බ්ලවුස්, සපත්තු, බූට් සහ පිළියෙල කළ ඇඳුම් නිෂ්පාදකයෝ සහ බෙදාහරින්නෝ. (4) ලියුම් භාරදීම සඳහා දෙරටෙහිවූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය :—— ; (5) පන්තිය : 38 ; (6) බඩු : 38 වෙනි පන්තියේ සියළුම භාණ්ඩ ; (7) වෙළඳ ලකුණේ සටහන :




මෙම වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමෙන් "හෝප්" සහ "ටාටා" යන වචන වලට තනි අයිතියක් නොලැබේ.

ජේ. එෆ්. පොන්නම්බලම්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,
1969 ජූනි මස 4.

11-381

---

(1) වෙළඳ ලකුණේ අංකය : 28,479 ; (2) ලැබුණ දිනය : 1966 නොවැම්බර් මස 16 වැනි දින ; (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : ස්ටැන්ඩර්ඩ් ඔයිල් කොම්පැණි, නව ජර්සිහි සමාගමකි, fප්ලේමින්ටන්හි ස්පීරව පිහිටා නව ජර්සි, යූ. ඇස්. ඒ. ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව් යෝක් 10020, නිව්යෝක්, 30, රොක්පෙලර් ප්ලාස්හි කායාීල සහිතව ; නිෂ්පාදකයෝ හා වෙළෙන්දෝ ; (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහිවූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය : ජූලියස් හා ක්‍රීස් මහතුන්, තැ. පෙ. 154, කොළඹ, (5) පන්තිය : 47 ; (6) බඩු : ඛණිජ තෙල් නිෂ්පාදන ; (7) වෙළඳ ලකුණේ සටහන :

**ENCO**

ජේ. එෆ්. පොන්නම්බලම්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,
1968 ඔක්තෝබර් 19 දින.

11-386

---

(1) වෙළඳ ලකුණේ අංකය : 28426 ; (2) ලැබුන දිනය : 1966 ඔක්තෝබර් මස 26 වෙනි දින ; (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : ලංකා ලයිට් ලිමිටඩ්, 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනත යටතේ ලියාපදිංචි කරන ලදී. මොරටුව ; ගිණිකූරු

නිෂ්පාදකයෝ; (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහිවූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ——-; (5) පන්තිය: 47; (6) බඩු: ගිණිකූරු; (7) වෙළඳ ලකුණේ සටහන:




ජේ. එෆ්. පොන්නම්බලම්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,
1966 දෙසැම්බර් 31 දින.
11-387

---

(1) වෙළඳ ලකුණේ අංකය: 29,399; (2) ලැබුණ දිනය: 1967 සැප්තැම්බර් මස 7 වෙනි දින; (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ෆාර්බ්වර්ක් හිච්ස්ට් ඇක්ටිඑන්ගෙස්ල්ෂාෆ්ට් වෝර්මල්ස් මෙයිස්ටර් ලුෂියස් ඇන්ඩ් බ්‍රෘනිං (බටහිර ජර්මන් සමූහාණ්ඩු ජනරජයේ, ජර්මනියේ නීති යටතේ සංස්ථාපිත බද්ධ වස්තු ව්‍යාපාර සමාගමකි) ෆ්‍රෑන්ක්ෆර්ට්/එම්-හිච්ස්ට් බ්‍රෘනිංස්ට්‍රැසි 45, බටහිර ජර්මනිය; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ; (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහිවූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: එෆ්. ජේ. හා ජී. ද සේරම් මහතුන්, තැ. පෙ. 212, කොළඹ; (5) පන්තිය: 1; (6) බඩු: කර්මාන්තයන්හි භාවිතා කෙරෙන රසායනික නිෂ්පාදන, වාර්නිස් වර්ග, ලැකර් වර්ග සහ රංගස්ථාපක සායම්; (7) වෙළඳ ලකුණේ සටහන:

**MOWILITH**

ජේ. එෆ්. පොන්නම්බලම්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,
1969 මාර්තු මස 10 වෙනි දින.
11-385

---

(1) වෙළඳ ලකුණේ අංකය: 30,726; (2) ලැබුණ දිනය: 1968 ඔක්තෝබර් මස 5 වෙනි දින; (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): කලි-වෙම් ඇක්ටිඑන්ගෙස්ල්ෂාෆ්ට් (බටහිර ජර්මනියේ නීති යටතේ සංස්ථාපිත වගකීම සීමාසහිත සමාගමකි), අංක 3, හැනෝවර්, පෙස්ට්පැච් 220, බටහිර ජර්මනිය; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ; (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහිවූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය: ඒබ්‍රහම්ස් මහතුන්, අංක 243, හල්ස්ඩෝෆ් වීථිය, කොළඹ 12; (5) පන්තිය: 2; (6) බඩු: කෘෂිකාර්මික ප්‍රයෝජනය සඳහා පොහොර; (7) වෙළඳ ලකුණේ සටහන:

**RHENANIA**

ජේ. එෆ්. පොන්නම්බලම්,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,
1969 මාර්තු මස 16 වෙනි දින.
11-374

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශොධිත ගාස්තු**

1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. පෝය දිනවලට පෙර දින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශන යන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නාමට එවිය යුතුයි

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත " පිටපත " **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. **1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. **68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 0 | ... | 60 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 0 | ... | 42 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 50 | ... | 51 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|---|
| (අ) | I ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුලත දී එක කොටසක් | 0 50 | ... | 0 20 |
| | II ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් | 1 0 | ... | 0 20 |
| (ආ) | I ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 30 | ... | 0 15 |
| | II ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 60 | ... | 0 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

## උපලේඛනය

## 1969

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජූනි | .. | 69. 6. 6 | සිකුරාද | ... | 69. 5.30 | සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.13 | සිකුරාද | ... | 69. 6. 6 | සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.20 | සිකුරාද | ... | 69. 6.13 | සිකුරාද | දවල් | 12.00 |
| | | 69. 6.27 | සිකුරාද | ... | 69. 6.20 | සිකුරාද | ප.ව. | 3.30 |
| ජූලි | ... | 69. 7. 4 | සිකුරාද | ... | 69. 6.27 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.11 | සිකුරාද | ... | 69. 7. 4 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.18 | සිකුරාද | ... | 69. 7.11 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 7.25 | සිකුරාද | ... | 69. 7.18 | සිකුරාද | ප.ව. | 3.30 |
| අගෝස්තු | ... | 69. 8. 1 | සිකුරාද | ... | 69. 7.25 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8. 8 | සිකුරාද | ... | 69. 8. 1 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.15 | සිකුරාද | ... | 69. 8. 8 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.22 | සිකුරාද | ... | 69. 8.15 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 8.29 | සිකුරාද | ... | 69. 8.22 | සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... | 69. 9. 5 | සිකුරාද | ... | 69. 8.29 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.12 | සිකුරාද | ... | 69. 9. 5 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.19 | සිකුරාද | ... | 69. 9.12 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69. 9.26 | සිකුරාද | ... | 69. 9.19 | සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 69.10. 2 | බ්‍රහස්පතින්ද | ... | 69. 9.26 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.10. 9 | බ්‍රහස්පතින්ද | ... | 69.10. 2 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.17 | සිකුරාද | ... | 69.10. 9 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.10.24 | සිකුරාද | ... | 69.10.17 | සිකුරාද | දවල් | 12.00 |
| | | 69.10.31 | සිකුරාද | ... | 69.10.24 | සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් | ... | 69.11. 7 | සිකුරාද | ... | 69.10.31 | සිකුරාද | දවල් | 12.00 |
| | | 69.11.14 | සිකුරාද | ... | 69.11. 6 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 69.11.21 | සිකුරාද | ... | 69.11.14 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.11.28 | සිකුරාද | ... | 69.11.21 | සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් | ... | 69.12. 5 | සිකුරාද | ... | 69.11.28 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.12 | සිකුරාද | ... | 69.12. 4 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 69.12.19 | සිකුරාද | ... | 69.12.12 | සිකුරාද | ප.ව. | 3.30 |
| | | 69.12.26 | සිකුරාද | ... | 69.12.18 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.